00019

(60)

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - (2015/I)**

පරිපාලනය (02 - I)

කාලය පැය 03යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.

---

01. රජයේ සේවය සඳහා පත් කිරීමේදී එම පත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටි රීති වල ඇති නියමයන් හා කොන්දේසි මොනවාද? කෙටියෙන් දක්වන්න.

02. රාජ්‍ය සේවකයෙකු ඔහුගේ ඉල්ලීම මත වෙනත් සේවාවක් සඳහා තාවකාලිකව හෝ ස්ථිරව හෝ මුදාහැරීමට හැකි අවස්ථා හා එසේ මුදාහැරීම ප්‍රතික්ෂේප කිරීමට හැකි අවස්ථා කෙටියෙන් විස්තර කරන්න.

03. ඔබ සේවය කරනු ලබන කාර්යාලයෙන් මහජනයාට ලබා දෙන සේවාවේ ඵලදායිත්වය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ආයතන ප්‍රධානියා ඔබට දන්වා ඇත. ඒ අනුව ඔබ විසින් සකස් කරන වැඩපිළිවෙල කෙටියෙන් දක්වන්න.

04. රාජ්‍ය නිළධාරියෙකුගේ සාමාන්‍ය හැසිරීම ආයතන සංග්‍රහයේ සවිස්තරව විග්‍රහ කර ඇත. ඒ අනුව රජයේ නිලධාරියකුගේ සාමානය හැසිරීම කෙසේ විය යුතුද? කෙටියෙන් දක්වන්න.

05. රජයේ නිළධාරියෙකු ජනමාධ්‍ය සඳහා ප්‍රවෘත්ති සැපයීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත ආයතන සංග්‍රහයේ II කොටස් XLVII පරිච්ඡේදයේ සවිස්තරව දක්වා ඇත. පරිච්ඡේද ප්‍රකාර රජයේ නිළධාරියෙකුට පවතින සීමා විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

06. රජයේ නිළධාරියෙකු කරන ලද වරදක් සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමේ බලය ඇත්තේ කාටද? එසේම නිකුත්කරනු ලබන චෝදනා පත්‍රයක් සංශෝදනය කළ හැකිද? එසේ නම් සංශෝදනය කළ හැකි අවස්ථා විස්තර කරන්න.

07. පහත සඳහන් 04ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    i. පත්වීම් බලධාරියා
    ii. අනියම් පත්කිරීම්
    iii. කලින් දැරූ තනතුරට පත්කිරීමේදී ගෙවන වැටුප
    iv. රැකවරණ නිලධාරියා
    v. ජ්‍යෙෂ්ඨත්වය
    vi. සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි

****************